සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/ MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ........................................
දිනය / திகதி / Date: 2025.08.04

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2023/07 ට තුන්වන එකතුව

සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන් / බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්
සමෘද්ධි බැංකු / බැංකු සමිති කළමණාකරුවන් වෙත .

**<u>සමෘද්ධි බැංකු මෘදුකාංග ගිණුම් ක්‍රියාවලිය මගින් බැංකු ගනුදෙනු කටයුතු පවත්වා ගෙන යෑම සඳහා වන මගපෙන්වීම - New Loan Application හා ස්ථාවර තැන්පතු විශේෂ පොලී අනුපාත සඳහා යෙදවුම(App ) හදුන්වාදීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් දැනට නිකුත් කර ඇති මගේ සමාංක හා 2023.10.03 දිනැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2023/07 හා ඊට එකතුන්ට වැඩිමනක් ලෙස මෙම නව එකතුව නිකුත් කරමි.

02. ශ්‍රී ලංකා ටෙලිකොම් සර්විසස් ( SLTS) ආයතනය විසින් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල පරිගණක මෘදුකාංග පද්ධතියේ ණය අයදුම්පත වැඩිදියුණු කර නව ණය අයදුම්පතක් නිර්මාණය කර ඇත.

2.1 ශ්‍රී ලංකා ටෙලිකොම් සර්විසස් බැංකු මෘදුකාංගය භාවිතා කරන සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් 2025.08.01 දින සිට ණය නිකුත් කිරිමේදි බැංකු මෘදුකාංගයට ඇතුලත් කරන ලද ( Up date) නව ණය අයදුම්පත භාවිතා කළ යුතුය. මෙම ණය අයදුම්පත භාවිතා කිරිමට අවශ්‍ය උපදෙස් ඇතුලත් වීඩියෝ පටයක් (User Demonstration) මේ සමග එවන අතර එම වීඩියෝපටය නරඹා නව ණය අයදුම්පත භාවිතා කිරිම සම්බන්ධ දැණුම හා පුහුණුව ලබා ගන්නා ලෙස දන්වමි.

2.2 මෙම බැංකු මෘදුකාංග සංවර්ධනය සමග හදුන්වා දෙන ණය අයදුම්පත පිළිබද වැඩිදුර දැණුමක් හා මගපෙන්වීම සඳහා පරිගණක මාදුකාංගය සඳහා පහසුකම් සලසන තොරතුරු තාක්ෂණ නිලධාරින් (A+) මගින් ඔබගේ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ කාර්යය මණ්ඩලයට අවශ්‍ය මුලික දැණුවත් කිරිමක් 2025.07.03 දින සිට 2025.07.17 දින දක්වා කාලය තුළ ලබාදීමට කටයුතු කර ඇති බැවින් එම අයගේ සේවය ලබා ගන්නා මෙන් තවදුරටත් දන්වමි.

03 . <u>ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොලී අනුපාත ලබාදීම</u>.


සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක2022/08 ට පස්වන එකතුවේ ඡේද අංක 05 මගින් ලබාදුන් උපදෙස් අනුව ස්ථාවර තැන්පතුකරුවන් සඳහා විශේෂ පොලි අනුපාතයන් ඉල්ලුම් කිරිම හා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාදීම සඳහා පරිගණක මෘදුකාංගය තුළ විශේෂ යෙදවුම (App) පහසුකම ලබාදි ඇත. මින් ඉදිරියට එවැනි විශේෂ පොලී අනුපාතයන් ඉල්ලුම් කිරිමේදී පහත පියවරයන් භාවිතා කර හදුන්වා දි ඇති යෙදවුම (App ) හරහා සිදුකළ යුතුය.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |


පියවර අංක1

**Dash Board ⟶ FD Deposit ⟶ FD Special Request**




පියවර අංක2

**FD Special Request ↓**




සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්
1. ලේකම් , ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.
3. දිස්ත්‍රික් ලේකම්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දැ.ගැ.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දැ.ගැ.ස.
5. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දැ.ගැ.ස.
6. සහකාර අධ්‍යක්ෂ, (තොරතුරු තාක්ෂණ,) - අ.ක.ස.
7. ප්‍රධාන විධායක නිලධාරි, SLTS - අ.ක.ස.